ජර්මන් ෆෙඩරල්
ජනරජය

Bundesamt
für Migration
und Flüchtlinge

euaa
EUROPEAN UNION
AGENCY FOR ASYLUM

# යුරෝඩැක් පිළිබඳ ව ඔබ දැනගත යුතු දේ



SINHALESE

## මට මෙම විස්තර පත්‍රිකාව ලැබෙන්නේ ඇයි?

ඔබට මෙම විස්තර පත්‍රිකාව ලැබෙන්නේ ඔබේ ජෛවමිතික දත්ත බලධාරීන් විසින් ලබා ගත යුතු බැවිනි.



ජෛවමිතික දත්ත යනුවෙන් අදහස් වන්නේ ඇඟිලි සලකුණු සහ ඔබේ ඡායාරූපයයි.



මෙම දත්ත, ඔබේ අනන්‍යතාවය පිළිබඳ ව තොරතුරු සහ අනෙකුත් අදාළ තොරතුරු සමඟ, යුරෝඩැක් දත්ත සමුදාය වෙත සම්ප්‍රේෂණය කෙරෙනු ඇත.

මෙම ක්‍රියාවලිය අතරතුර ඔබට ඇති අයිතීන් සහ ඔබෙන් අපේක්ෂා කරන දේ පිළිබඳ ව මෙම විස්තර පත්‍රිකාවේ පැහැදිළි කර ඇත.

## යුරෝඩැක් යනු කුමක්ද?

යුරෝඩැක් යනු EU+ රටවලට ඇතුළු වන ඇතැම් පුද්ගල කාණ්ඩ පිළිබඳ ව තොරතුරු ගබඩා කර සංසන්දනය කරන යුරෝපීය දත්ත සමුදායකි. මෙම කාණ්ඩ මෙම විස්තර පත්‍රිකාවේ විස්තර කර ඇත.

මෙම දත්ත සමුදාය EU+ රටවල් 31ක් විසින් භාවිත කරනු ලබන අතර ඔවුන්ට ඔබේ දත්ත සැසඳීමේ සහ ඔබේ තොරතුරු ලබාගැනීමේ හැකියාව ඇත. ඔබ අවසරයකින් තොරව වෙනත් EU+ රටකට ගමන් කර ඔබේ දත්ත නැවත ලබා ගනු ලැබුවේ නම්, යුරෝඩැක්හි ගබඩා කර ඇති ඔබේ සියලුම දත්ත එම රටේ බලධාරීන් විසින් දකිනු ඇත. ඇතැම් අවස්ථාවල දී, ඔබේ දත්ත නව තොරතුරු සමඟ යාවත්කාලීන කෙරෙනු ඇත.

## EU+ කාණ්ඩයට අයත් රටවල් මොනවාද?

**ඔබ දැන් ජර්මනියේ සිටින අතර, එය EU+ රටකි.**
**EU+ රටවල් වන්නේ:**

යුරෝපීය සංගමයේ (EU) සාමාජික රටවල් 27: බෙල්ජියම, බල්ගේරියාව, ඩෙන්මාර්කය, ජර්මනිය, එස්තෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ග්‍රීසිය, අයර්ලන්තය, ඉතාලිය, ක්‍රොඒෂියාව, ලැට්වියාව, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, ඔස්ට්‍රියාව, පෝලන්තය, පෘතුගාලය, රුමේනියාව, ස්වීඩනය, ස්ලෝවැකියාව, ස්ලෝවේනියාව, ස්පාඤ්ඤය, චෙකියාව, හංගේරියාව සහ සයිප්‍රසය

අනෙකුත් රටවල් 4: අයිස්ලන්තය, ලීච්ටන්ස්ටයින්, නෝර්වේ, ස්විට්සර්ලන්තය.

# යුරෝඩැක්හි අරමුණ කුමක්ද?

යුරෝඩැක්හි ප්‍රධාන අරමුණු පහක් ඇත:

- ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන අයදුම්පතක් පරීක්ෂා කිරීම සඳහා වගකිව යුතු රට තීරණය කිරීමට EU+ රටවලට උපකාර කිරීමට
- EU+ රටවලට ක්‍රමවත් සහ අක්‍රමවත් සංක්‍රමණ නිරීක්ෂණයට උපකාර කිරීමට
- ජාතික බලධාරීන් අතර තොරතුරු හුවමාරු කර ගැනීමට සහ අපරාධ සහ ත්‍රස්තවාදය වැළැක්වීමට
- යුරෝපයට පැමිණෙන දරුවන් සොයා ගැනීමට සහ ආරක්ෂා කිරීමට හැකි බව සහතික කරගැනීමට
- වීසා වැනි අංශ පිළිබඳ ව තොරතුරු අඩංගු අනෙකුත් යුරෝපීය දත්ත සමුදායන් නිවැරදි ව ක්‍රියාත්මක වන බව සහතික කරගැනීමට.



# යුරෝඩැක්හි ගබඩා කර ඇත්තේ කාගේ දත්ත ද?

යුරෝඩැක්හි EU+ රටක ජාතිකයන් නොවන පහත සඳහන් දේ කළ පුද්ගලයින්ගේ දත්ත අඩංගු වේ:

- ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා ඉල්ලුම් කළ
- අවසරයකින් තොරව EU+ රටක දේශසීමාව තරණය කළ
- මුහුදේ දී බේරා ගැනීමෙන් පසු EU+ රටකට ගොඩබස්වා ඇති
- EU+ රටක නීති විරෝධී ලෙස නැවතී සිටින
- යුරෝපීය සංගම් නැවත පදිංචි කරවීමේ සහ මානුෂීය ඇතුළත් කිරීමේ වැඩසටහනක් හෝ ජාතික නැවත පදිංචි කරවීමේ වැඩසටහනක් හරහා EU+ රටකට පැමිණි
- තාවකාලික ආරක්ෂාව ලබා දී ඇති.

## මගේ දත්ත දැකිය හැක්කේ කාටද?

EU+ රටේ ජාතික රැකවරණ බලධාරීන් ඔබේ ජෛවමිතික දත්ත ලබාගෙන අනෙකුත් අදාළ දත්ත සමඟ යුරෝඩැක් වෙත සම්ප්‍රේෂණය කර සංසන්දනයේ ප්‍රතිඵලය ලබා ගනියි.

බරපතල අපරාධ සහ ත්‍රස්තවාදය වැළැක්වීම, අනාවරණය කිරීම සහ විමර්ශනය කිරීම සඳහා යුරෝපීය සංගම් නීති බලාත්මක කිරීමේ සහයෝගීතා ආයතනය සහ ජාතික පොලිසිය යුරෝඩැක් වෙත ප්‍රවේශය ඉල්ලා සිටිය හැකිය. ඔවුන් යුරෝඩැක්හි ඔබේ දත්ත සෙවිය හැකිය.

**වැදගත්!** ඔබේ මව් රටේ බලධාරීන්ට මෙම තොරතුරු වෙත ප්‍රවේශ වීමට නොහැකි වනු ඇත.

## මම මගේ ඇඟිලි සලකුණු ලබාදීම ප්‍රතික්ෂේප කළහොත් කුමක් සිදුවේ ද?



ඔබේ ජෛවමිතික දත්ත ලබා දීමට ඔබ නීතියෙන් බැඳී සිටියි.

ඔබේ ඇඟිලි සලකුණු අවශ්‍ය වීමට වැදගත් හේතු තිබේ. ඔබ රැකවරණය සඳහා ඉල්ලුම් කර ඇත්නම්, මෙය ක්‍රිය පටිපාටියේ අත්‍යවශ්‍ය පියවරකි.

ඇඟිලි සලකුණු දත්ත EU+ රටවල සිටින පවුලේ සාමාජිකයන් සොයා ගැනීමට ද උපකාර කළ හැකිය.

ඔබේ ඇඟිලි තුඩුවලට හානි සිදු වී ඇත්නම්, අනාගතයේ දී ඇඟිලි සලකුණු නැවත ලබා ගනු ඇත.

ඔබ හිතාමතාම ඔබේ ඇඟිලි සලකුණු වලට හානි කළහොත්, අවාසිදායක ප්‍රතිවිපාක ඇති වනු ඇත.

උදාහරණයක් ලෙස, ඔබ රැකවරණය සඳහා අයදුම්පතක් ඉදිරිපත් කර ඇත්නම්, ක්‍රියාපටිපාටිය නතර විය හැකිය.

ඔබේ තත්ත්වයේ දී ක්‍රියාපටිපාටිය නතර කළහොත්, මෙයින් අදහස් වන්නේ ඔබ තවදුරටත් අයදුම්කරුවෙකු (රැකවරණය සොයන්නෙකු) ලෙස නොසැලකෙන බවයි. මේ මොහොතේ සහ අනාගතයේ දී එම තත්ත්වයට අදාළ සියලුම අයිතීන් ඔබට අහිමි වනු ඇත.

EU+ රටවල බලධාරීන් ඔබේ ජෛවමිතික දත්ත ලබා ගැනීම සඳහා අවසාන විකල්පය ලෙස බලහත්කාරය භාවිත කළ හැකිය. ඔබේ අනන්‍යතාවය තීරණය කිරීමට හෝ සත්‍යාපනය කිරීමට අවසාන විකල්පය ලෙස ඔවුන් ඔබව රඳවා තබා ගත හැකිය.

ඔබ ඔබේ ඇඟිලි සලකුණු දත්ත මේ රටේ බලධාරීන්ට ලබා දීම ප්‍රතික්ෂේප කළහොත්, නිශ්චිත ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදුවනු ඇත.

ඔබේ ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඔබේ සරණාගතභාවය සඳහා වූ අයදුම්පත ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත.

## මගේ යුරෝඩැක් දත්තවලට අදාළව මගේ අයිතීන් මොනවාද?

සෑම EU+ රටකටම දත්ත භාවිතය පාලනය කරන අධිකාරියක් තිබේ. ඔබට දත්ත පාලක සහ දත්ත ආරක්ෂණ නිලධාරියා අමතා යුරෝඩැක්හි ගබඩා කර ඇති ඔබේ දත්ත වෙත ප්‍රවේශ වීම සඳහා ඉල්ලා සිටීමට අයිතිය ඇත.

ඔබේ තොරතුරු පහත පරිදි යැයි ඔබට හැඟේ නම් එය නිවැරදි කරන ලෙස ඉල්ලා සිටිය හැකිය:

- සාවද්‍ය වන අතර නිවැරදි කළ යුතුය
- අසම්පූර්ණ වන අතර යාවත්කාලීන කළ යුතුය

ඔබේ තොරතුරු පහත පරිදි යැයි ඔබට හැඟේ නම් ඔබේ තොරතුරු මකා දමන ලෙස අපගෙන් ඉල්ලා සිටිය හැකිය:

- නීති විරෝධී ලෙස යුරෝඩැක් වෙත ඇතුළත් කර ඇත.

මෙම විස්තර පත්‍රිකාවේ අවසාන පිටුවේ, '**වෙනත් ප්‍රයෝජනවත් තොරතුරු**' යන මාතෘකාවෙන් දත්ත පාලක සහ දත්ත ආරක්ෂණ නිලධාරියාගේ සම්බන්ධතා තොරතුරු ඔබට සොයාගත හැකිය.

ඔබේ දත්ත හැසිරවීම පිළිබඳ ව විධිමත් පැමිණිල්ලක් කිරීමට ඔබ කැමති නම්, ඔබට ජාතික අධීක්ෂණ අධිකාරිය ඇමතිය හැකිය.

මෙම විස්තර පත්‍රිකාවේ අවසාන පිටුවෙන් ජාතික අධීක්ෂණ අධිකාරියේ සම්බන්ධතා තොරතුරු ඔබට සොයාගත හැකිය.

# වෙනත් ප්‍රයෝජනවත් තොරතුරු

## දත්ත පාලක කාර්යාලයේ සම්බන්ධතා තොරතුරු පිළිබඳ විස්තර

මේ රටේ දත්ත පාලක කාර්යාලය සහ දත්ත ආරක්ෂණ නිලධාරියා සම්බන්ධ කරගන්නා ආකාරය පිළිබඳ ව තොරතුරු ඔබට පහතින් සොයාගත හැකිය.

යුරෝඩැක්හි ගබඩා කර ඇත්තේ ඔබේ කුමන පුද්ගලික දත්තද යන්න දත්ත පාලකයට ඔබට දැනුම් දිය හැකිය. ඔබේ පුද්ගලික දත්ත නිවැරදිව ගබඩා කර නොමැති නම්, ඔබට මෙම දත්ත නිවැරදි කරන ලෙස ඉල්ලා සිටිය හැකිය.

ඔබේ යම් තොරතුරක් නීති විරෝධී ලෙස හසුරුවා ඇති බව ඔබට හැඟේ නම්, පහත සම්බන්ධතා තොරතුරු භාවිත කර එම තොරතුරු මකා දැමීමට ඉල්ලා සිටිය හැකිය.

සංක්‍රමණය සහ සරණාගතයින් සඳහා වන ෆෙඩරල් කාර්යාලය (BAMF)

Frankenstraße 210, 90461 Nürnberg

දුරකථන: +49 (0)911 943 0

ෆැක්ස්: +49 (0)911 943 10000

විද්‍යුත් තැපෑල: service@bamf.bund.de

## ජාතික අධීක්ෂණ බලධාරීන්ගේ සම්බන්ධතා තොරතුරු පිළිබඳ විස්තර

මෙම රටේ ජාතික අධීක්ෂණ අධිකාරිය හා සම්බන්ධ වීමට ඔබට පහත තොරතුරු භාවිත කළ හැකිය.

ඔබේ පුද්ගලික දත්ත කිසිවක් නීති විරෝධී ලෙස හසුරුවා ඇති බව ඔබට හැඟේ නම්, ඔබට ජාතික අධීක්ෂණ අධිකාරියට විධිමත් පැමිණිල්ලක් කළ හැකිය.

දත්ත ආරක්ෂාව සහ තොරතුරු නිදහස පිළිබඳ ෆෙඩරල් කොමසාරිස්වරයා

Graurheindorfer Str. 153, 53117 Bonn

දුරකථන: +49 (0)228 997799-0

විද්‍යුත් තැපෑල: poststelle@bfdi.bund.de

# මගේ සටහන්

සංක්‍රමණ හා
සරණාගතයන්
පිළිබඳ ෆෙඩරල්
කාර්යාලය

මෙම විස්තර පත්‍රිකාව තොරතුරු දැනගැනීමේ අරමුණු සඳහා පමණි. එමගින් අයිතීන් හෝ වගකීම් නිර්මාණය නොකරයි. මෙම ලේඛනයේ ප්‍රධාන කොටස සපයා ඇත්තේ යුරෝපීය සංගමයේ රැකවරණය සඳහා වූ ආයතනය (EUAA) විසින් වන අතර, මෙම විස්තර පත්‍රිකාව පිටපත් කිරීම සහ වෙනස් කිරීම සඳහා EUAA විසින් අවසර දී ඇත්තේ EU සාමාජික රටවල් සඳහා පමණි. මෙම විස්තර පත්‍රිකාවේ ඇතුළත් තොරතුරුවල නිරවද්‍යතාවය, අන්තර්ගතය, පරිපූර්ණත්වය, නීත්‍යානුකූලභාවය හෝ විශ්වසනීයත්වය සඳහා EU සාමාජික රටවල හෝ වෙනත් වගකිවයුතු තෙවන පාර්ශවයක කිසිදු වගකීමක් හෝ වගවීමක් EUAA විසින් පිළි නොගැනේ. මෙම විස්තර පත්‍රිකාවේ අන්තර්ගත තොරතුරු මඟින් නිර්මාණය කළ හැකි යම් භාවිතයක් සඳහා EUAA හෝ EUAA වෙනුවෙන් ක්‍රියා කරන කිසිදු පුද්ගලයෙකු වගකිව යුතු නොවේ.

© European Union Agency for Asylum, 2025